SD&CC

# ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය

# රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

# පුරප්පාඩු

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ පළමු ශ්‍රේණියේ ආයතනයක් ලෙස ලියාපදිංචි, ජාත්‍යන්තර ප්‍රමිති ආයතනයේ ISO 9001 : 2015 සහතිකලත් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛ සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් ආයතනයක ප්‍රවීන වෘත්තිකයින් කණ්ඩායමක් සමග සේවය කිරීමේ සුවිශේෂීය අවස්ථාවකි.

මෙම ආයතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. සිවිල් ඉංජිනේරු - II ශ්‍රේණිය (MM 1-2)

**සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සිවිල් ඉංජිනේරු උපාධිය ලබා තිබීම.

අදාළ ක්ෂේත්‍රයේ පාලම් ඉදිකිරීම, මහල් ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධව පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වැටුප** : සාකච්ඡා කර තීරණය කළ හැකිය. සුදුසුකම් හා පළපුරුද්ද මත තීරණය වේ.

**වයස** : අවුරුදු 22 ට නොඅඩු හා 55 ට නොවැඩි විය යුතුය.

## 02. බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු - III ශ්‍රේණිය (PL 3)

**සුදුසුකම්** : ඉහත තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ හතර 4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජෙනරාල් විසින් නිකුත් කළ බර වාහන මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම හා රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර පහ (05) ක පළපුරුද්ද ලබා තිබීම.

❖ ආයතනය සතු යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳව ප්‍රමාණවත් පළපුරුද්දක් ලබා ඇති අයදුම්කරුවන් සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වැටුප ක්‍රමය** : PL-3

රු. 26290-10X270-10X300-10X330-12X350-39490/-

**වයස** : අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.

සුදුසුකම් ලත් අයදුම්කරුවන් සඳහා පහත ප්‍රතිලාභ ද හිමිවේ.

- ➢ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
- ➢ වාර්ෂික වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්
- ➢ වාර්ෂික ප්‍රසාද දීමනා
- ➢ දිරි දීමනා

සුදුසුකම් පිළිබඳ සම්පූර්ණ විස්තර සහ සහතික පිටපත් ඇතුළත් අයදුම්පත්, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා දුරකථන අංකද සමග මෙම දැන්වීමේ දින සිට දින 10 ක් ඇතුළත ජ්‍යෙෂ්ඨ කළමනාකාර (මානව සම්පත් හා පරිපාලන) වෙත ලැබෙන සේ එවිය යුතුය. අයදුම්කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

**සභාපති,**
**රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව,**
**අංක. 07, බොරුපන පාර, රත්මලාන.**

**"යටිතල පහසුකම් ඉදිකිරීම් පිළිබඳ පුරෝගාමියෝ"**